# ප්‍රාග් බෞද්ධ ස්වර්ග සංකල්පයේ ආරම්භයට සදචාර පසුබිමක් තිබේද?

කථිකාචාර්ය මැදවච්චියේ ධම්මජෝති හිමි

වෛදික යුගයේ ස්වර්ගය සම්බන්ධ පැහැදිලි අදහස් දෙකක් විද්‍යාමාන වේ.

I ස්වර්ගය ස්වභාව ධර්මය ඇසුරින් නිර්මාණය කර ගත්තකි.

II ස්වර්ගය පින්ඵල වශයෙන් මරණින් මතු යා හැකි සැපවත් ලෝකයකි. සදචාරය හා සම්බන්ධ වන්නේ මෙහි දෙවන අදහසයි.

එනම් මෙලොව යහපත් ක්‍රියාවන්හි ප්‍රතිඵලයක් වශයෙන් යා හැකි ලෝකයකි යන්න යි. මේ අදහස වෛදික ආර්යයන් තුළ ඇතිවන්නට ඇත්තේ පරලොව පිළිබඳ හැඟීම ඔවුන් තුළ පහළ වන්නේ ඍග් වේද යුගයේ අවසාන භාගයේ පමණ බව විචාරක මතයකි.[1] මෙහි දී ඔවුන්ගේ අවධානයට ලක්වී ඇති සාධකය වන්නේ පින්ඵල විපාක හා පුනරුත්පත්තිය සඳහන් තන්ත්‍ර පාඨය[2] අන්තර්ගත වන ඍග් වේදයේ දහ වන (10) මණ්ඩලය එහි සෙසු කොටස් වලට වඩා පසු කාලීන වශයෙන් පිළිගැනීම යි.[3] ලෝකය පිළිබඳ ඉතාමත් ම ප්‍රාථමික වර්ගීකරණය විය යුත්තේ මෙලොව හා පරලොව වශයෙන් ද්විත්ව වන බව තවත් එක් විචාරක මතයකි.[4] එහිදී පරලොව පිහිටියේ

1 ඍග් වේද ප්‍රදීපය පි.24 - ගණපාල සේනාධීර- පෙරමුණමුද්‍රණාලය - 1954
2. සාග් 14.8. - ඍග් වේද සංහිතා - භට්ටාචාර්යතුමා ඖෂධ නගරය - 1940
සංගච්ඡස්ව පිතෘභිඃ සංයමේනේෂ්ටා - පූර්තේන පරමේව්‍යෝමන්
හිත්වා යාවද්‍යං පුනරස්තමේහි - සංගච්ඡස්ව තන්වා සුවර්චාඃ
3 A. Vedic Readar for students "Introduction" - pxvi by Macdonell Englatnd - 1957 (oxford univesity press)
4 Eancyclopaedia of Buddhism P.421. vol.v "Heven and Hell" by C.Witanachchi - Colombo 1992.

මෙම පෘථිවි තලය තුළ ම ය. සමහර ප්‍රාථමික සමාජවල පරලොව පොළොව යට පිහිටි බව ද අන්තර් භෞමික මාර්ගයකින් මළවුන් අහසට ගිය බව ද පිළිගෙන තිබුණි.

වෛදිකයන්ගේ දිව්‍යලෝක විවරණය පරලොව හා පිතෘලෝකය පිළිබඳ චින්තනයේ විකාශනයක් වශයෙන් කල්පනා කළ හැකි ය. පිතෘලෝකය ඈත අහසේ ඉහළ තැනක පිහිටියකි. එහි උපන් මුල් පුද්ගලයා යම ය. ඔහු එන සෙසු අයට ඉඩ පහසුකම් සලසා දෙයි.[1] වෛදික පිතෘලෝකය හා දිව්‍යලෝකය මුල් කාලයේ එකක් වශයෙන් සැළකිණි.[2] මෙම දේව පිතෘ දෙ පිරිස ම එකට විසූ බවට සාධක ඍග් වේදයේ හමු වේ.[3] එසේම වේද හා බ්‍රාහ්මණ ග්‍රන්ථවල පවා සූර්යා සමග මිනිසාගේ ඒකත්වය යනුවෙන් අදහස් කරන්නේ පිතෘ ලෝකය බව කීත් පවසයි.[4] එය දෙව්ලොව පිළිබඳ පැවති මුල් අදහස් හා දෙවන අදහස් සංකලනය වූ අවස්ථාවක් වශයෙන් අපට පෙන්වා දිය හැකි ය. පිතෘලෝකය නැතහොත් තුන් වැනි දෙව්ලොව මුල් ස්වර්ගය මෙන් සදාකාලිකත්වයෙන් හා අමතත්වයෙන් සලකා තිබේ.[5]

1 ඍග් 14.2
යමෝ නෝ ගාතු ප්‍රථමෝ - විවේද නෛෂා ගව්‍යූතිරපභර්තවා
යාත්‍රා නඃ පූර්වේ පිතරඃ පරේයුරේනා යඥාතාඃ පථ්‍ය අනුස්වාඃ
2 ඍග් 14.7
ප්‍රේහි ප්‍රේහි පථිභි පූර්ව්‍යෙභිර්යත්‍රානඃ පූර්වේ පිතරඃ පරේයු
උභා රාජානා ස්වර්ධයා මදන්තා යමං පශ්‍යාසි වරුණං ච දේවම්
3 The Religion and phihilosophy of the Ueda and upanisads - P 407. Part - 11 by A.B. Keith Dehi - 1980.
4 ඍග් 1 113.9.
ලොකයත්‍ර ජ්‍යෝතිශ්මනතස්තත්‍ර මාමමෘතං කුධීන්ධ්‍රා යේන්ධෝ පරිශ්‍රව
යත්‍රානු කාමං චරණං ත්‍රිනාකේ තිදිවේ දිවඃ
5 අථර්ව වේදයේ (18.4.56) ස්වර්ගං යතාං පිතෘං (ස්වර්ගයට යන පියා) - Loka - World and heven in the Veda. P.74 by Jan Gonda - Amsterdan - 1966.



නමුත් ඍග් වේද යුගයේ අවසාන භාගය වන විට ස්වර්ගයේ සදාකාලිකත්වය නැතහොත් අමෘතත්වය පිළිබඳ ව යම් සැකයක් පහළ ව තිබූ බවට අනුමාන කළ හැකි ය.

'වෙඩරුයෙන් හරවත් වූ බලිය (යාග පූජාව) පුදා යම (රජු) වෙතට එළඹෙව. හේ (යමරජ) දෙවියන් අතරෙහි බොහෝ කල් ජීවත්වනු සඳහා අපට වරම් දේවා'[1]

මෙහි දිව්‍යලෝකයේ බොහෝකල් ජීවත් වනු සඳහා (දීර්ඝායු) කරන ඉල්ලීමක් මිස එහි අමෘතත්වය හෝ සදාකාලිකත්වය පිළිබඳ ප්‍රාර්ථනයක් නො වේ. මෙය පසුකාලීන (බ්‍රාහ්මණ උපනිෂද්) පියවරුන්ගේ නැවත මනුලොව උපත පිළිබඳ සංකල්පයේ බීජමය අවස්ථා වක් වශයෙන් සැලකීමට ද බොහෝ දුරට ඉඩ කඩ තිබේ.

මෙම පියවරුන් හා දෙවිවරුන් ස්වර්ගයේ එකට විසුව ද ඔවුන් එකිනෙකාට වෙනස් ය. ඍග් වේදය හා අථර්ව වේදය ඇසුරින් ඒ පිළිබඳ විග්‍රහයක යෙදෙන ඒ.බී.කීත් මහතා[2]

'දෙවියන්ගේ මාර්ගය නිතරම පියවරුන්ගේ මාර්ගයට වඩා ශ්‍රේෂ්ඨත්ව යෙන් දක්වා ඇත. පියවරුන්ගේ පාරට වඩා බල්ලන්ගේ පැමිණීමෙන් එය විශේෂත්වයෙන් දැක්වෙන අතර එය දෙවියන්ගේ සාමකාමී මාර්ගය නොවේ. දෙව්ලොව දොර පිහිටා තිබෙන්නේ ඊසාන දිගට වන අතර පිතෘලෝකයේ එය ගිනිකොණින් ය...'

දෙවියන් හා පියවරුන් අතර මෙබඳු විශේෂතා පහළ වන්නේ වෛදික යන් තුළ හටගත් ඍත සංකල්පය හා ඒ හා බැඳුණු ඉෂ්ටාපූර්ථය (දෙවියන්ට හා පූජක යන්ට තුටු පඬුරු දීම) නිසා බව සිතිය හැකි ය.

1 ඍග් වේද ප්‍රදීපය පිට 27 (ඍග් 14.14)
යාමය ඝෘතවද්හවිර්ජුහෝත ප්‍රච තිෂ්ඨත
සනෝ ද්වේෂවා යමද් දීර්ඝමායුඃ ප්‍රජීවසේ
2 The Religion and Phicosolphy of the Veda and Upnisads Part - ii P 411

සෘතයට අනුව ජීවත් වන්නන් ද සාමාන්‍ය මළවුන්ගේ තත්වයටම පත්වන්නේ නම් තම සෘතවත් වීම නිෂ්ඵල ලෙස සිතීමට ඉඩ තිබුණි. එය අහුරා දමන වෛදික චින්තකයන් සෘතවත් වූවන්ට දේවත්වය පිරිනම යි. එසේ නොවන්නන් පිතෘත්වය ලබයි. මේ අනුව මුලින් සමානත්වයෙන් සැළකූ මෙම දෙ පිරිස අතර වෙනස්කම් ඇතිවී යන අයුරු පැහැදිලි වේ. මළ සියලූ ම දෙනා මුලින් හැඳින්වූයේ පිතෘ නැතහොත් ප්‍රේත යන පළල් අර්ථයෙන්[1] වුවද එය කල්යෑමේ දී පිතෘ හා දේව යන වචනවලින් සීමිතාර්ථයන් උද්දීපනය වේ. එනම් පිතෘ යන්නෙන් සාමාන්‍යයෙන් මැරෙන අය ද දේව යන්නෙන් සෘතවත් අය ද දක්වා තිබේ. පසුකාලීන බෞද්ධ පොත්වල (පේතවත්ථු - විමානවත්ථු) සමහර කථා ප්‍රේත හා දේව යන උභයාර්ථයෙන් ම සලකා මිශ්‍රව යොදා ඇත්තේ ද[2] මුලින් මෙම දෙ පිරිස ම එකම ලෝකයක (පිතෘ ලෝකය) සිට පසුව වෙන්වී යෑමේ හේතුව නිසාය.

දෙව්ලොවට යා හැකි මාර්ගය වශයෙන් මුල් ආර්යයන් සලකන ලද්දේ ඔවුන්ගේ ක්‍රියාවන්ට වඩා දෙවියන් කෙරෙහි ඇති විශ්වාසය බව ඒ.බී. කීත් මහතා පවසයි.[3] නමුත් තපස් රැකීමෙන් බ්‍රාහ්මණ පූජකයන්ට දන්දීමෙන් හා යුද්ධයේ දී දිවි පුදන වීරයන් ද දෙව්ලොව යන බවට සෘග්වේද යුගයේ පටන් ම පිළිගෙන තිබුණි.[4] එහෙත් ඔවුන් දෙව් ලොව යෑම සඳහා විශ්වාසය තබන ලද්දේ දෙවියන් කෙරෙහි ය.[5]

---

1 Dictionary of the Pali language - p. 378 "Peta which is a Pali form of the sanskrit preta literally means "he who has gone forth" "he is completeley gone here from " " the departed one" and hence " the departed spirit - of a dead person.
2 The Buddhist Conception of sperits - p22
3 The Religion and phiolsophy of the meda adn upanisads P 409
4 Vedic mythology - P 167 by Macdonell, England Amsterdam - 1966.
5 සෘග් 1 . 113. 7.
තස්මිං මාන් ධෙහි පවමානාමෘතේ ලෝකේ අක්ෂිත ඉන්ද්‍රායේන්ධෝ
පරිශ්‍රව යත්‍ර රාජා වෛවශ්වතෝ යත්‍රාව රෝධනං දිවඃ



එම නිසා දෙවියන් සතුටු කිරීම සඳහා ඉෂ්ටා පූර්ත දෙන ලදී. ඊතුළින් ඔවුහු පරලොව (දෙව්ලොව) සැප ප්‍රර්ථනා කළෝ ය. මේ ගමනේදී උපකාර කරන්නා අග්නිහු ය. (ගින්නය)[1] අග්නිතෙමේ සියලූ යාග ද්‍රව්‍යයන් පරලොව වෙත ගෙනයන වාහකයා වේ.[2] මින් දෙව්ලොව යාහැකි ආකාරය පිළිබඳව පැවති වෛදික චින්තනය අපට උකහා ගත හැකි ය. එහි විද්‍යාමාන වන ආධිපත්‍යය හුදෙක් මානව කේන්ද්‍රිය වූවක් නොවන අතර දේවාධිපත්‍යයට යටකොට තිබේ. සෘතයට අනුව ඉෂ්ටාපූර්ත කරන අය දෙව්ලොව යන අතර සාමාන්‍යයෙන් මැරෙන අය එහි පියවරුන් වශයෙන් උපදියි. නමුත් සෘතයට පටහැනිව ජීවත් වූවන්ට ද මරණින් මතු තත්වයන් ලැබීම සාධාරණ නොවේ. එම නිසා ඔවුන් සඳහා අපාය සංකල්පය නිර්මානය කරගත් බව බොහෝ විචාරක මතයකි.[3] රාධාකෘෂ්ණන් අපාය සංකල්පය බ්‍රාහ්මණ යුගයට අයත් ලෙස දක්වා තිබේ.[4] ඊට ප්‍රථම සෘග්වේද යුගයේ පව්කාරයා මරණින් පසු උච්ඡින්න වී යන බවට පිළිගෙන තිබුණු බව ඔහු තවදුරටත් පවසයි. මරණින් පසු පව්කාරයා නැවත උපදින්නේ නැතැයි වෛදිකයන් විශ්වාස කළ බව ඒ.බී.කීත් ද දක්වා ඇති අතර දුෂ්කෘත කරන අයට අන්ධකාර සහිත අගාධයක සදාකාලික දුක් ලැබෙන බවට ඔවුන් ඇදහූ විරල විශ්වාස ද ඇතැයි ඔහු පෙන්වා දී ඇත.[5]

---

1 සෘග් 14.13.
යමාය සෝමං සුනුත. යමාය ජුහුතා හවිඃ
යමං හ යඥෝ ගච්ත්‍යග්නී දූතො අරඩිකෘතඃ
2 සෘග් 1.143.7
සෘත ප්‍රතීකංච සෘත ධූර්ෂදමග්නිං මිත්‍රං සමිධානසෘඤ්පතේ ඉන්ධානො
අක්‍රෝ විදථේසු දිද්‍යච්ජු වර්‍ණමුදුනෝ යංසතේධියම්
3 Encyclopaedia of Buddhism p422 VOL. V.
4 ඉන්දිය දර්ශනය පි. 96, (සිංහලපරිබර්ශංනය) රාධාකෘෂ්ණන්, අධ්‍යාපන ප්‍රකාශන දේපාර්තමේන්තුව කොළඹ 1970.
5 The Religion and philosophy of the veda and upanisads - P 409. part. II

කෙසේ නමුත් අපාය සංකල්පය දේවලෝක සංකල්පයට ප්‍රතිපක්ෂව දේවලෝක සංකල්පයට පසුව ඇතිවූවක් වශයෙන් අපට මෙහිදී පෙන්වාදිය හැකිය.

වෛදික යුගයේ බොහෝ සංකල්ප විකාශනය හා සංවර්ධනය වී යන්නේ බ්‍රාහ්මණ හා උපනිෂද් යුගවල ය. දිව්‍යලෝකය හා ඍත සංකල්පය ද මෙහිදී වර්ධනය වී ඇත. දෙව්ලොවට යා හැකි මාර්ගය වශයෙන් මෙකල සලකනු ලබන්නේ 'දේවවිශ්වාසය' නොව යාගය යි. බ්‍රාහ්මණ ග්‍රන්ථවල යාගය කෙතරම් දියුණු වූයේ ද යත් එය මිනිසාගේ හා දෙවියාගේ ආශාවන් (ප්‍රාර්ථනාවන්) සම්පූර්ණ කරන්නකි.[1] එය වෛදිකයන් තුළ පැවති ඍත සංකල්පය හා බැඳුණු ඉෂ්ටාර්ථපූර්තයේ අධික විකාශනයක් වශයෙන් සැළකිය හැකිය. ඍග් වේද යුගයේ දෙව්ලොව යෑම සඳහා පැවති දේව විශ්වාසය නැතහොත් දෙවියන් සතුටු කිරීම වෙනුවට බ්‍රාහ්මණ යුගයේ යාගය පැමිණේ. එය දෙවියනට ද වඩා උසස් තත්වයකට පත්කර තිබේ. දේව සහව්‍යතාවය සඳහා වැදගත් වන්නේ දෙවියන්ට වඩා යාගය යි. එමනිසා එය බ්‍රාහ්මණ ග්‍රන්ථවල එන දෙව්ලොව ගමන සම්බන්ධ විකාශනීය ලක්ෂණයක් වශයෙන් සඳහන් කළ හැකිය. යාග හෝම පැවැත්වීම තුළින් ලබන පුණ්‍ය ඵලය පිළිබඳව අදහස් වැඩීයාමත් සමග ඊට අනුරූපව ස්වර්ග සම්පත්තියේ ඇතිවන විවිධතා ගැන ද බ්‍රාහ්මණ ග්‍රන්ථයන් විස්තර කරනු පෙනේ. වැඩියෙන් සැප සම්පත් වැඩියෙන් යාග පැවැත්වූවන් ලබන බව ඉන් කියැවිණි. මේ අදහස් වැඩීයාමේ ප්‍රතිඵලයක් වශයෙන් මරණින් මතු ලැබිය හැකි ගති දෙකක් ගැන සඳහන් වේ[2] දේවත්වය ලැබිය හැක්කේ ස්වල්ප දෙනෙකුට බවත් වැඩිදෙනා මියගොස් පිතෘ ලෝකයේ උපදින බවද දැක්වේ.[3]

---

1 Encyclopaedia of Buddhism - P 422. VOL. V.
2 සතපථ බ්‍රාහ්මණ VI. 6.2.4.
3 එම VI. 6.24.



'අර්චිර් මාර්ග' 'ධූම මාර්ග' (ආලෝකවත් මග හා අඳුරුමග) යනුවෙන් ද මෙම දෙමග හැඳින්වේ. දේව හා පිතෘ යානය ගැන සඳහන් ඍග් වේද යුගයේ පටන් ම දක්නට ලැබිය හැකි[1] අතර ඒ පිලිබඳ පැහැදිලි විස්තර හමුවන්නේ බ්‍රාහ්මණ හා උපනිෂද් ග්‍රන්ථවල ය. එම නිසා වේද ග්‍රන්ථවල අප්‍රකටව ආ මෙම යාන දෙක බ්‍රාහ්මණ ග්‍රන්ථවලින් පැහැදිලි ලෙස ප්‍රකට වී ඇති අයුරු අනාවරණය වේ. අනෙක් අතට වේද යුගයේ පියවරුන් හා දෙවිවරුන් එකට විසූව ද එකිනෙකාට වෙනස් බව ඉහතින් දැක්විණි. එම වෙනසේ සංවර්ධනයක් වශයෙන් ද මෙම බ්‍රාහ්මණ (දේවලෝකය) දේවයානය (පිතෘ ලෝකය) හා පිතෘ යානය හැඳින්වීමට පුළුවන. එම නිසා බ්‍රාහ්මණ යුගය වන විට මෙම යාන දෙකින් යන්නවුන් නිසා පැහැදිලි ලෙස ම දේව ලෝකය හා පිතෘලෝකය වශයෙන් වෙන් වෙන් වූ ලෝක දෙකක් නිර්මාණය වූහ යි අපට සිතිය හැකි ය.

යම් සීමිත පුණ්‍ය ශක්තියක බලයෙන් ස්වර්ගයේ උපදින්නාන්ට එම පින ගෙවී ගිය පසු සිදුවන්නේ කුමක් ද? යන ප්‍රශ්නය පැන නැගුණි.[2] පින් ගෙවීමෙන් චුතවන්නන් නැවත පෘථිවියේ උපත ලබතැයි මේ අනුව අදහස් කෙරිණි. සමහර විට මෙය ඉහතින් දක්වන ලද ස්වර්ගයේ අමෘතත්වය ගැන සැක කළ අප්‍රකට සඳහනේ ප්‍රකට අවස්ථාවක් වශයෙන් ද අපට අනුමාන කළ හැකිය. නමුත් සාමාන්‍යයෙන් වෛදික දේවලෝකය සදාකාලික වන අතර බ්‍රාහ්මණ යුගයේ 'පුනර්මෘත්‍යු සංකල්පය' නිසා යම් සීමිත පුණ්‍ය ඵලයකින් දෙව්ලොව අමරණීයත්වය ලැබිය නො හැකි විය. මේ නිසා මෙම යුග දෙකේ දේවලෝක සංකල්පයේ පැහැදිලිව ම එකිනෙකට වෙනස් ස්වරූපයක් දැකිය හැකි ය.

---

1 ඍග් 18.1
පරං - මෘත්‍යා අනුපරේහි පන්ථාං - යස්තෙ ස්ව ඉතරෝ දේවනාත්
චක්ෂුස්මතේ ශෘඩ්වතේ තේ බ්‍රවීමි - මානඃ ප්‍රජාං රීරිෂෝ මොතං වීරාන්
2 බුදුසමයේ උදාව පි. 28, රත්නපුරේ රාහුල හිමි නුගේගොඩ 1995.

මේ අනුව වෛදිකයන් තුළ පැවති ස්වර්ගය පිළිබඳ දෙවන අදහස (ස්වර්ගය පින් ඵල විඳින ලෝකයකි) ඍත හා යාග සංකල්පය (කර්ම සංකල්පය) සමග බැඳී වෛදික හා බ්‍රාහ්මණ ග්‍රන්ථවල සංවර්ධනය වී විකාශනය වන ආකාරය ඉතාමත් පැහැදිලි ය. එය පරලොව සංකල්පයෙන් ආරම්භ වී පිතෘ ලෝකය හරහා ආ ගමනකි. මුලින් සදාකාලිකත් වයෙන් සැලකූ අතර පසුව බ්‍රාහ්මණ සමයේ 'පුනර්මෘත්‍යු සංකල්පයෙන්' තාවකාලික පින්ඵල විඳින ස්ථානයක් බවට පත්වේ.

බ්‍රාහ්මණවලින් පසුව එන උපනිෂද්වල ද ස්වර්ග සංකල්පයේ වැඩීයාම දැකිය හැකි ය. බ්‍රාහ්මණ යුගයේ ආ යඥ මාර්ගය' වෙනුවට උපනිෂද් යුගයේ 'ඥාන මාර්ගය' පැමිණේ. බෘහදාරණ්‍යක උපනිෂදයේ එය මෙසේ සඳහන් වී ඇත.

'ලෝක තුනකි. ඒ මිනිස් ලොව, පිතෘ ලොව හා දේවලොව යනුයි... පිතෘ ලෝකයට යා හැක්කේ යාග යෙනි. දෙව්ලොවට යා හැක්කේ ඥානයෙනි.'[1]

නමුත් එහි දී තපස, බ්‍රහ්මචරියාව, ශ්‍රද්ධාව වැනි මාර්ග ද ඉවත් කර නැත. ඒවා තුළින් ද දෙව්ලොව යා හැකිය.[2] නමුත් සියල්ලට ම ප්‍රධාන වන්නේ විද්‍යාව යි. ඥානය යි. මේ අනුව මෙතෙක් දෙව්ලොව යෑම සඳහා පැවති සදාචාරය සම්බන්ධ මාර්ගයට ඥානය ද එක්වී ප්‍රධානත්වය ගෙන ඇත.

පිතෘ යානය හා දේව යානය පිළිබඳව පැහැදිලි නිගමන අපට හමුවන්නේ බ්‍රාහ්මණවලට වඩා උපනිෂද්වලිනි. පිතෘයානයෙන් යන අය නැවත ආපසු පැමිණේ. පිතෘ ලොකයට ඔහු යන්නේ ඉෂ්ටාර්ථපූරථ කර්ම බලයෙනි.[3]

---

1 බෘහදාරණ්‍යක උපනිෂද් (1. 05. 17)
2 ප්‍රශ්න උපනිෂද් (1. 10.)
3 ප්‍රශ්න උපනිෂද් (1.9.)



නමුත් දේවයානයෙන් යන්නවුන් නැවත නො පැමිණේ. සදාකාලිකත්වයට පත්වේ. නැවත නූපදී.[1] ප්‍රශ්න උපනිෂදයේ පිතෘ ලෝකය වශයෙන් චන්ද්‍රයා ද දේව ලෝකය වශයෙන් සූර්යයා ද සලකා තිබේ.[2] ඡාන්දොග්‍ය උපනිෂදයෙහි දේවයානය ම බ්‍රහ්ම යානය වශයෙන් ගෙන තිබේ.[3]

'තපස් රැකීම ශ්‍රද්ධාව යයි සිමිත් වනයෙහි තපස් රකින අය ද ජීවත් වී මැරෙන බව දන්නා අය ද චිතකයෙහි ගිනි සිළුවට පිවිසෙත්. ගිනිසිළුවෙන් දවසට ද දවසින් ශුක්ල පක්ෂයට ද ශුක්ල පක්ෂයෙන් උත්තරායන වර්ෂාර්ධයට ද වර්ෂාර්ධයෙන් වර්ෂයට ද වර්ෂයෙන් සූර්යයාට ද සූර්යයාගෙන් චන්ද්‍රයාට ද චන්ද්‍රයාගෙන් විදුලියට ද... යෙත්' ..... මේ දේව යානය යි. බ්‍රහ්ම යානය යි. මේ මග ගත් අය නැවත මිනිස් බවට නො පැමිණෙත්. කිසි කලෙක නො පැමිණෙත්.[4]

මේ පිළිබඳ විග්‍රහයක යෙදෙන ජේ.තිලකසිරි මහතා ආත්මය අනුක්‍රමයෙන් දේවයානයෙහි කෙළවර වූ ආලෝකයේ ආලෝකය නමින් හැඳින්වෙන (ජ්‍යොතිෂාංජ්‍යොතිෂ්) බ්‍රහ්ම පදයට සම්ප්‍රාප්ත වන බව දක්වා තිබේ.[5] එමනිසා දිව්‍යලෝකයට ඉහළින් බ්‍රහ්ම ලෝකය පිහිටා ඇතැයි උපනිෂද් චින්තකයන් සිතූ බව අපට කල්පනා කළ හැකි ය. මීට හේතුව වශයෙන් සැලකිය හැක්කේ උපනිෂද් යුගයේ 'ආත්මන්' 'බ්‍රහ්මන්' සංකල්පවලට වඩාත් උසස් ස්ථානයක් ලැබීම යි. එයිනුත් බ්‍රහ්මන්' සියල්ලට ම අධිපති ලෙස සලකන ලදී.[6] එම නිසා බ්‍රහ්මන්ගේ ලොව දෙව්ලොවට ද වඩා ඉහළින් ම තබන ලදී. මේ අනුව බ්‍රහ්මන්ගේ ලෝකයට යා හැක්කේ දේවලෝකය හරහා ය. දෙව්ලොව යෑම සඳහා මහා 'බ්‍රහ්මයාට ගරු කිරීම ද හේතු වන බව දැක්වෙන[7] බැවින් එහි විකාශනය පැහැදිලි කෙරේ.

---

1 ප්‍රශ්න උපනිෂද් (1.10.)
2 ප්‍රශ්න උපනිෂද් (1.10)
3 ඡාන්දෝග්‍ය උපනිෂද් (5.10.1.)
4. ඡාන්දෝග්‍ය උපනිෂද් (4.15.6.)
5 වෛදික සාහිත්‍යය පි. 128, ජේ තිලකසිරි, කැලණිය - 1958.
6. ඡාන්දෝග්‍ය උපනිෂද් (111.14.1) 'සර්වං ඛලු ඉදං බ්‍රහ්ම'
7. කෞෂිතකී උපනිෂද් (4.8.)

වෛදික යුගයේ සිට බ්‍රාහ්මණ යුගය හරහා ආ ප්‍රාග් බෞද්ධ 'ස්වර්ග' සංකල්පය සෘතය, යාගය, හා ඥානය සමග ඒ ඒ යුගවල මුසු වී සංවර්ධනය වෙමින් ආ ආකාරය ඉහත විග්‍රහයෙන් මැනවින් ප්‍රකට විය. යම් යම් අඩු ලුහුඬුකම්[1] තිබුණත් වෛදික ස්වර්ගය සදාචාරය හා බැඳුණකි. එහි ආරම්භය සඳහා හේතු සාධක වූයේ මරණ, භීතිය හා පරලොව පිළිබඳ හැඟීම ය.

1 Encyclopaedia of Buddhism - p 423. VOL. V.
(ඉහත සඳහන් සියලු උපනිෂද් ග්‍රන්ථ හියුම්ගේ ඉංග්‍රිසි පරිවර්තන බව සළකන්න.)